විදෙස්ගත ශ්‍රී ලාංකේය විශ්‍රාමිකයන්ගේ ගැටලු සඳහා පිළියම්

ඔස්ට්‍රේලියාවේ ජීවත්වන ශ්‍රී ලාංකේය විශ්‍රාමිකයන්ට තම මාසික දීමනා ලබාගැනීමේ දී මතු වීය හැකි ප්‍රායෝගික ගැටලු සහ අසීරුතා පිළිබඳව සාකච්ඡා කොට විසඳුම් ළබා දීම සහ අනන්‍යතාසිය විශ්‍රාමිකයන්ගේ දීමනා ගෙවීම වැඩිකර දීමත් කිරීම සඳහා ආයතනික වශයෙන් කළ හැකි වැඩිදියුණුකිරීම් හඳුනා ගැනීමේ අරමුණෙන් ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාළ් ගේ ඒ තිලකරත්න මහතාත් අතිරේක අධ්‍යක්ෂ ජනරාළ් ඩී එම් ආර් ජේ ඒ කුරේ මහතාත් පසුගිය දිනෙක ඔස්ට්‍රේලියාවේ සංචාරයක නිරත වූහ. ඔස්ට්‍රේලියා ශ්‍රී ලංකා හා කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කරන ලද මෙම සංචාරයේ දී කැන්බරා සහ මෙල්බන් නගරවල පදිංචි වෙමින්සිටින විශ්‍රාමිකයන්ට තම ගැටලු පිළිබඳව ඔවුන් සමග සාකච්ඡා කිරීමට අවස්ථාව උදා වීම මෙහෙවීන් වැදගත් වීය ඔස්ට්‍රේලියාවේ පදිංචි විශ්‍රාමිකයන් මුහුණ දෙන ගැටලු පිළිබඳව අධ්‍යක්ෂ ජනරාළ්වරයා සමග සාකච්ඡා කොට මෙම ලිපිය සකස් කරන ලද්දේ ජනමාධ්‍ය ආමාත්‍යතාංශයේ ගිටපු ලේඛක සහතාර මෙල්බන් ශ්‍රීයානි මද්දුමගේ මහත්මිය විසිනි මේ සඳහා ඉව කඩ සලසා දුන් මෙල්බන්හි සෙන්ට් ගිල්බන්ස් විහාරාධිපති ස්වාමීන්-වහන්සේට අපේ හෘදයාංගම ස්තූතිය පුද කරමු

වසර ගණනාවක් සිය මව්බිම වෙනුවෙන් විවිධාකාරයෙන් සිය සේවය ඉටු කොට විශ්‍රාම ගිය ජෙෂේෂ්ඨ පුරවැසියන් එම රටේ හෝරාවකට හා සැළකීමට පාත්‍රවීම ඕනෑම ධටක සිදුවන දෙයක් ඔස්ට්‍රේලියාව වැනි රටවල නම් මධ්‍ය දීමනා මෙමේ සහන පත්‍ර ලබාදීම වැනි විවිධ ආකාර වලින් ඔවුන් වෙත ප්‍රතිලාභ ප්‍රදානය කෙරෙනවා. ශ්‍රී ලංකාවේ මේ කාර්ය භාරයට උර දෙන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ විශ්‍රාමිකයන් වෙත ලබා දෙනු ලබන සේවාවන් ගැන කෙටි හැඳින්වීමක් කළොත්

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය පළාත් සභා මෙන්ම ආරක්ෂක සේවාවන්හි නිරත වුවන්ගේ විශ්‍රාම වැටුප් වලට අදාල සියලු කටයුතු ඉටු කෙරෙන්නේ මෙම දෙපාර්තමේන්තුව මගින් එපමණක් නොව වෙන්දුමු අනන්දුරු අරමුදල මෙන්ම රජයේ සේවකයන්ගේ අර්ථ සාධක අරමුදලට අදාල සියලු කටයුතු ද පවරෙන්නේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවටයි.

2006 වසරේ රජයේ ඇගවයෙන් විශ්‍රාම වැටුප් සඳහා වෙන් කළ මුදල රුපියල් බිලියන 59 ක් වූ අතර එය රජයේ ආදායමෙන් 11.5% ක ප්‍රතිශතයක් මේ අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කොතරම් විශාල සේවා දායකයන් සංඛ්‍යාවකට සෙත සළසන ආයතනයක් ද යන්න පහසුවැටි වනවා.

රාජ්‍ය අංශයේ විශ්‍රාමිකයන්ට හිමිවන ප්‍රතිලාභ ගැන වස්තර කළොත්

විශ්‍රාමිකයන්ට ඇති ප්‍රතිලාභ ප්‍රධාන කොටස් හතරකට වර්ග කළ හැකි ය.

1 රාජ්‍ය විශ්‍රාම වැටුප්
රජයේ සේවකයන් අධිකරණ සේවා නිලධාරීන් ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරුවන් ආරක්ෂක සේවා වල නිලධාරීන් සහ පළාත් රාජ්‍ය සේවකයන් සඳහා ගෙවන මාසික විශ්‍රාම වැටුප් සහ විශ්‍රාමික පාරිතොෂික

2 වෙන්දුමු අනන්දුරු විශ්‍රාමික අරමුදල
මේ යටතේ මියගිය සහකරුවා වෙනුවෙන් ජීවත් වන සැමියාට හෝ බිරිඳට හිමිවන මාසික දීමනා අනන් දුරන්න් සඳහා වන දීමනා සහ අංගවිකල දරුවන් සඳහා හිමිවන දීමනා

3 රජයේ සේවක අර්ථසාධක අරමුදල
විශ්‍රාම වැටුප් රහිත රජයේ සේවකයන් සඳහා වන අර්ථසාධක දීමනා

4 වෙනත් පාරිතෝෂික
මරණ පාරිතෝෂික දින වැටුප් ගන්නා සේවකයන් සඳහා වන පාරිතෝෂික රජයේ සේවයේ නියුතුව සිටියදී මිය ගිය අයගේ යැපෙන්නන් සඳහා හිමිවන දීමනා සේවයේ යෙදී සිටියදී සිදුවූ අනතුරු හේතුවෙන් තවදුරටත් සේවය කළ නොහැකි තත්වයන්හිදී ගෙවන දීමනා සහ මාස 120 ක සේවා කාලයක් සපුරා නොමැති සේවකයන් සඳහා වන විශ්‍රාම පාරිතෝෂික

විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් කිම හැක්කේ කාටද?

රජයේ ස්වකයකුගේ විශ්‍රාම වැටුපකට හිමිකම් කිම සඳහා සපුරා ලිය යුතු අවශ්‍යතා තුනක් තිබෙනවා.

1 තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වීම
2 සේවය ස්ථිර කොට තිබීය යුතුයි
3 අවම වශයෙන් මාස 120 ක සේවා කාලයක් සම්පූර්ණකර තිබිය යුතුයි

අපි දැන් අනේවාසික විශ්‍රාමිකයනට අදාල වන ප්‍රායෝගික ගැටලු කිපයක් පිළිබඳව සාකච්ඡා කළොත් සුදුසු යයි මම හිතනවා.

අනේවාසික විශ්‍රාමිකයන්ට සිය මාසික දීමනාව ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ජීවන සහතිකය නියමිත පරිදි ඉදිරිපත් නොකිරීම නිසා හෝ ඊට අදාල ගැටලු හේතුවෙන් විශ්‍රාම වැටුප් ගෙවීම නැවතෙන අවස්ථා බහුලයි. විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මෙම ජීවන සහතිකයේ ඇති වැදගත් කම කුමක්ද?

විශ්‍රාමිකයෙකු විදේශයක ජීවත් වුවත් විශ්‍රාම වැටුප ලබාගන්නේ ලංකාවෙන් නම් ඔහු සැළකෙන්නේ විදේශ විශ්‍රාම වැටුප් ලබාගන්නා අයෙකු ලෙස නොවෙයි. එවිට එම පුද්ගලයාට විශ්‍රාම වැටුප ගෙවන්නේ ඔහු පදිංචිව සිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ළබා දෙන අනුමැතියට අනුව අදාල ළැයකුත් විසින් මෙම දීමනාව ඔවුන්ගේ ගිණුමට බැර කරනු ළබනවා. විශ්‍රාමිකයා පදිංචිව සිටින්නේ විදේශයක නම් ඔහුට විශ්‍රාම වැටුප ළබාගැනීම සඳහා තමන් ජීවත්වව සිටින ළව සමාව කෙරෙන සහතිකයක් මාස්පතා ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුයි. මෙම සහතිකයේ එම පුද්ගලයාගේ තොරතුරු නිවැරදිව සපයන් කොට තිබීම අනිවාර්ය අවශ්‍යතාවයක් එම සහතිකය නොමැතිව ලංකාවේ පදිංචිය නොමැති විශ්‍රාමිකයන්ට අදාල ගෙවීම් කිරීමට ප්‍රාදේශීය ලේකම්ට හැකියාවක් නැහැ. මෙම සහතිකය අනිවාර්ය කොට ඇත්තේ මීය ගිය පුද්ගලයන්ගේ විශ්‍රාම වැටුප් වංචාසහගත ළෙස වෙනත් පුද්ගලයන් ළබාගත් අවස්ථා බොහොමයක් ඇති බැවිනුයි. යම් හේතුවක් නිසා එක් මායයක ජීවන සහතිකය අදාල කාර්යාලයට නොළැබුණාහොත් ඊළඟ මාසයේ දී එම සහතිකය ඉදිරිපත් කොට තිබෙන්නේ නම් හිග මුදළද සමග ගෙවීම් කරන ළෙස ප්‍රදේශීය ලේකම්වරුන් වෙත උපදෙස් දී තිබෙනවා

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ගැබේ පන්තුළව ආ ඳ ÷ අධ්‍යක්ෂ ජනරාළ් ගේ ඒ තිලකරත්න මහතාත් අතිරේක අධ්‍යක්ෂ ජනරාළ් ඩී එම් ආර් ජේ ඒ කුරේ මහතාත් ශ්‍රීයානි මද්දුමගේ මහත්මිය සහ ශ්‍රීයානි මද්දුමගේ මහතා සමග

එසේ වුවත් විදේශගත විශ්‍රාමිකයන්ගේ වැටුප් ගෙවීම නතරකර ඇති අවස්ථා බොහෝවිට අසන්නට ලැබෙනවා. එම අයට තම වැටුප බැංකු ගිණුමට බැර වී නොමැති බව දැනගැනීමට ලැබෙන්නේ වසර ගණනාවකට පසුව ලංකාවට ගිය පසුවයි. එමෙන්ම ලංකාවේ ගතකරන කෝර්ගාලය තුළ එම ගෙවීම් යැවවත් කරගැනීමට දරන උත්සාහයන් ව්‍යවර්ථ වූ බවද අසන්නට ලැබෙනවා. මේ තත්වය මගහරවා ගත හැක්කේ කෙසේ ද?

ලංකාවේ පදිංචි විශ්‍රාමිකයෙක් පමුවරට විදේශයකට යාමට තීරණය කරන්නේ නම් තම විශ්‍රාම වැටුප සමීධාව ලියා කළ යුතු ආකාරයක් තිබෙනවා. පළමුවෙන් ඔහු හෝ අය ප්‍රාදේශීය ලේකම්වරයා හමුවේ තමන් විදේශ ගත වන බව දැනුම්දිය යුතු අතර තමන් වෙනත් කිසිම යන දිශය රටින් බැහැරව සිටින කාලය තුළ තමන්ගේ ළිපිනය වැනි තොරතුරු ප්‍රාදේශීය ලේකම්වරයා වෙත දැනුම් දිය යුතුයි. ලංකාවේ ජීවත් වන අයෙකුට සහ විදේශයක වෙසෙන අයෙකුට විශ්‍රාම වැටුප් ගෙවීම ගිණුම් ගත කෙරෙන ආකාරය වෙනස් මේ ක්‍රමයට දැනුම් නොදී රටින් බැහැරවීම නිසා විශ්‍රාම වැටුප ගෙවීම අසීරු වන්නට පුළුවන් නියමිත පරිදි දැනුම් දී වසරේ ගත වීමේන් පසු ජීවන සහතිකය මාස්පතා ප්‍රාදේශීය ලේකම් වෙත එවීමෙන් තම දීමනාව නොකඩවා තම ගිණුමට බැර කරවා ගත හැකියි. එමෙන්ම තමන් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් වෙත ළබා දී අති බැවින් දුරකථනයෙන් හෝ ලිඛිතව තමන්ට යම් ගැටළුවක් තිබේ නම් විසඳා ගැනීම ද පහසු වෙනවා

විදේශ වල පදිංචි විශ්‍රාමිකයන්ගේ දීමනා ගෙවීම පිළිබඳව ප්‍රධානම ගැටළුව වන්නේ අනන්‍යතාව ස්ථිර කර ගැනීමයි. රජයේ මුදල් රෙගුලාසි වලට අනුව ගෙවීම් කරන නිලධාරියා තමන් ගෙවීම කරන්නේ තිවැරදි පුද්ගලයාටද යන්න සනාථ කර නොගෙන ගෙවීම සිදුකිරීමට බැහැර. එපමණක් නොව වසර ගණනාවක් දීමනා නොගෙවීම නිසා විශාල මුදලක් එකතු වී තිබෙන විට ගෙවීම් කරන නිලධාරියා එම ගෙවීම පිළිබඳව විශේෂයෙන් සැළකිලිමත් වනවා ගෙවීය යුතු හිග මුදල විශාල වන විට ගෙවීම සඳහා දිසා ලේකම් වරයාගේ අනුමැතිය ළබාගත යුතු වෙනවා. මුදල් ප්‍රමාණය ඊටත් විශාල නම් ගෙවීම නැහැ. එය නැතී වන්නේ තමන් බන්ධනාගාර ගත වුවහොත් පමණයි. තමන් විදේශයක ජීවත් වුවත් ළංකාවට පැමිණි විටක අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කර තම වැටුප ළබාගත හැකියි. හොඳම පිළියම වන්නේ තමන් ළංකාවට පැමිණි විගස අදාල ප්‍රාදේශීය ලේකම් හමු වී ගැටලු සාකච්ඡා කිරීමයි. එය ප්‍රදේශීය ලේකම් වෙටමෙන් විසඳාගත නොහැකි නම් අධ්‍යක්ෂ ජනරාළ්වරයා වෙත කරුණු ඉදිරිපත් කළ හැකියි.

විදේශයක ජීවත් වන විශ්‍රාමිකයන්ට තම වැටුප එලිදී ළබා ගත හැකි ක්‍රමයක් තිබේ ද?

අත්ත වශයෙන්ම අනේවාසික විශ්‍රාමිකයෙකුට තම වැටුප එම රටේ ශ්‍රී ළංකා තානාපති කාර්යාළයෙන් ළබාගැනීමට හැකියාවක් තිබෙනවා. මේ සඳහා ඉදිළිමක් කළ හැකි අතර ඒ අනුව අදාළ ළිපි ගොනු එම මහ කොමසාරිස් කාර්යාළයට මාරු කර එවනවා. එසේ වුවත් තවමත් මෙම පහසුකමෙන් ප්‍රයෝජනය ගන්නේ සුළු පිරිසක් පමණයි. ඉදිරියේ දී මේ සඳහා ඇති ආයතනික පහසුකම් තව දුරටත් වැඩිදියුණු කිරීමෙන් තධසුතු කෙරෙමින් පවතිනවා. එමෙන්ම ශ්‍රී ළංකාවේ පුරවැසිභාවය නොමැති විශ්‍රාමිකයන් සඳහා ගෙවීම් කළ හැක්කේ අනේවාසික ගිණුමකට පමණක් බව ද දැන සිටීම වැදගත්.

විදේශයක ජීවත්වන විශ්‍රාමිකයන්ගේ දීමනාව තාවකාලිකව නැවැත්වීමට මූලික වීය හැකි හේතු සඳහන් කළොත්

විශ්‍රාම වැටුප ගෙවීමට අදාළව එක් එක් පුද්ගළයාට ඇති ගැටලු විවිධාකාරයි. විදේශ වල ජීවත් වන පුද්ගළයන් යම් විටක තම විශ්‍රාමික මව හෝ පියාගේ උරුමය පිළිබඳව ළළිළිම් කරනවා. විදේශයක සිට කරන එවැනි ළළිළිම් විභාගකොට තීරණ ගැනීම අසීරුයි. මුදල් ගෙවීමේදී අනන්‍යතාව තහවුරු කිරීම අත්‍යවශ්‍ය බැවින් තමන් ළංකාවට පැමිණ පොද්ගළිකව එවැනි ළළිළිම් ඉදිරිපත් කිරීම

36 වන පිටිව